www.wsws.org ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# කලු ජාතිකයන්ගේ අභිවෘද්ධිය උදෙසා වූ ජාතික සංගමය ඉදිරියේ පැවැත්වූ ඔබාමාගේ දේශනය

## Obama's speech to the NAACP

2009 ජුලි 18

ජුලි 16 දින පවත්වන ලද කලුජාතිකයන්ගේ අභිවෘද්ධිය උදෙසා වූ ජාතික සංගමයෙහි (එන්ඒඒසීපී) ශත සංවත්සර රැස්වීම ඉදිරියේ බරාක් ඔබාමාගේ දේශනයෙහි මුඛ්‍ය තේමාව වූයේ කම්කරු පන්තික, අප්‍රිකානු ඇමරිකානුවන් කරවටක් ගිලී සිටින සමාජ අර්බුදයේ වරද ඔවුන් පිටම පැටවීම ය.

කලු පැහැ ගත් කම්කරුවන් මුහුන දෙන සමාජ දුගීභාවයේ තරම පිලිබඳව ඔබාමා පැහැදිලි කලේය. අප්‍රිකානු ඇමරිකානුවන් ''අන් සියලු කොටස්වලට වඩා සේවා වියුක්තියට භාජනය වී ඇතැයි ද ඔවුන් රෝග ගනනාවකට ගොදුරු වීමේ ඉඩකඩ වැඩි නමුදු සෞඛ්‍ය රක්ෂනයට හිමිකම් කීමේ ඉඩ ඇහිරී ඇතැයි ද'' ජනාධිපති කියා සිටියේ ය. රටේ දැවැන්ත බන්ධනාගාර පද්ධතිය තුල සමානුපාතික නොවන අන්දමේ විශාල අප්‍රිකානු-ඇමරිකානුවන් සංඛ්‍යාවක් සිරගතවී සිටීම හා ඒඩ්ස් රෝගයට ගොදුරු වීම ගැන ද ඔබාමා සඳහන් කලේ ය.

නිවාස වෙන්දේසි කිරීමේ අර්බුදය, නිවෙස් අහිමිවීම නගර තුල පොදු අධ්‍යාපනය කඩා වැටීම යනාදිය ද ඇතුල් කිරීමට ඔබාමාට ඉඩ තිබුනු නමුත් කප්පාදු කල මෙම ලැයිස්තුව ඉදිරිපත් කරන්නේ අප්‍රිකානු ඇමරිකානු කම්කරුවන්ට පමනක් සීමා වී නොමැති නමුත් ඔවුන් මුහුන දෙන කටුක තත්ත්වයන් පිලිබඳ අල්පමාත්‍ර දර්ශකයක් පමනි.

එහෙත් මේ දුක්ඛිතබවට හේතුව කුමක් ද? එය ලිහිල් කිරීමට ඔබාමා අදහස් කරන්නේ කවරාකාරයකින් ද?

කම්කරු පන්තියේ පුලුල් කොටස් මුහුන දෙන අර්බුදය උග්‍ර කරන්නා වූ සමාජ වැඩ සටහන් විනාශකිරීම යුක්තිසහගත කිරීම සඳහා ''පෞද්ගලික වගකීම'' පිලිබඳ සියලු දක්ෂිනාංශික බෙහෙත් වට්ටෝරු ඔබාමා ද යොදාගත්තේ ය.

''ආන්ඩුවේ වැඩ සටහන් තුලින් පමනක් අපගේ ලමුන් පොරොන්දුවේ දේශය කරා ගෙන නොයනු ඇත''යි ඔබාමා ප්‍රකාශ කලේ ය. අන් අයුරින් දක්වතොත්, කාලවර්න කම්කරුවන්ට ඔබාමා පාලන තන්ත්‍රයෙන් සැලකිය යුතු සමාජ ආධාර අපේක්ෂා කල නොහැක. ඒ වෙනුවට අවශ්‍ය වනුයේ ''නව චින්තන රටාවක් හා නව ආකල්ප පෙලකැ'' යි ඔබාමා කියා සිටියේ ය.

ඔබාමාට අනුව ''වෙනස්කම් කිරීමෙහි දිගුකල් පවත්නා හා විනාශකාරී දායාදයක් වනුයේ සීමා කිරීම පිලිබඳ හැඟීම අප තුල අභ්‍යන්තරීකරනය වී ඇති ආකාරයයි. අප ප්‍රජාව තුල බොහෝ දෙනා ලෝකයාගෙන් හා තමන්ගෙන් ම අපේක්ෂා කරන දෑ ඉතා අල්ප වීමේ පිලිවෙල එයයි.''

මෙය, ඩැනියෙල් පැට්‍රික් මොයිනිහාන්ගේ පුලුල් ලෙස අපකීර්තියට ලක්වූ ''දුගීබවේ සංස්කෘතිය'' පිලිබඳ න්‍යායෙහි පුනරාවර්ජනයක් බවට ඔබාමා තුල අවබෝධයක් තිබූ බවට සැකයක් තිබිය නොහැක. කලු ජාතීන් අතර දුගීබව සාරභූත වශයෙන් ම ''නීග්‍රෝ ජාතික පවුල'' තුල පවතින්නට හැරි සමාජ ව්‍යාධිවේදයක් බව කියාපාන 1965 වසරේ දී පල කරන ලද අධ්‍යයනයක කර්තෘත්වය දැරුවේ (පසු කලෙක ඩිමොක්‍රටික් සෙනෙට් සභිකයෙකු වූ) මේ සමාජ විද්‍යාඥයා ය. සුඛසාධක පද්ධතිය විනාශ කිරීමේ ව්‍යායාමය තුල මේ සංකල්පනයන් සුවිශේෂ ස්ථානයක් දැරීය.

තමන් අත් විඳින කටුක සමාජ තත්ත්වයන් කලු ජාතික තරුනයින්ට ආන්ඩුවේ ආධාර ලබා දීම සාධාරනීකරනය කිරීමට හේතුවක් නොවන බව ඔබාමා පැහැදිලි කලේ ය. ආර්ථික ගැටලු තිබිය හැකි වුව ද ''අඩු ලකුනු මට්ටම් ලබාගැනීමට, පන්තිවලින් කට්ටි පැනීමට, පාසැලින් ඉවත්වීමට එය හේතුවක් කර නොගත යුතු බව'' ඔහු ප්‍රකාශ කලේ ය.

අපගේ ලමුන්ට අප මේසේ කිව යුතු ය... ඔබේ ඉරනම ඇත්තේ ඔබ අතේ ය.... නිදහසට කරුනු නොමැත.... ඒ සියලු දුෂ්කරතා තුලින් ඔබ ශක්තිමත් කරනු ඇත. තරගයෙහි යෙදීම සඳහා ඔබ වඩාත් සුදුස්සෙක් කරනු ඇත.'' ඔබාමාට අනුව සාගින්න, නිවෙස් අහිමිකම, පොලිස් හිරිහැර, ''නිදහසට කරුනු'' නොවනවා පමනක් නොව, මේ ''දුෂ්කරතා'' සැබැවින්ම යහපත් වේ. ඒවා කලු ජාතික තරුනයින් වඩා ශක්තිමත් කරයි. තරගයෙහි යෙදීමට සමත් අය බවට පත් කරයි.

ජනාධිපති දෙමාපියන්ගේ කාර්යභාරයට අදාල ගුරුහැකම් කිහිපයක් පවා පිලින්වයි. ''දෙමාපියන් වෙත .... දෙමාපියන්ගේ වගකීම කිසි සේත්ම වෙනත් අයෙකුට කොන්ත්‍රාත් දීමට හැකි දෙයක් නොවේ ය''යි ඔහු උපදෙස් දුනි. ''එහි අරුත වන්නේ වැඩිහිටියන්ට සීමා වූ

රූපවාහිනිය ඉවත්කිරීමයි. කල් වේලා ඇතිව අප ලමුන් නින්දට යෑමට සැලැස්වීමයි''

සුදු පැහැති දේශපාලඥයෙකු එවන් ප්‍රකාශ කලේ නම්, ඔහු හෝ ඇය වර්ගවාදියෙකු ලෙස හංවඩු ගසනු ලැබ ප්‍රහාරයට ලක්වීම පිලිබඳව සැකයක් තිබිය නොහැක. එනමුදු ඔබාමාගේ සමේ වර්නය හේතු කොට ගෙන ඔහුගේ වදන් ''දැඩි සෙනෙහස'' දැක්වීමක් ලෙස උනුසුම්ව පිලිගැනේ. මෑතක අප්‍රිකාවේ දී ඔබාමා ඊට බොහෝ සෙයින් සමාන වූ දේශනයක් කලේ ය. එහි දී ඔහු තර්ක කලේ අධිරාජ්‍යවාදය විසින් වඩාත්ම අලාපාලුකරන ලද මහාද්වීපය වැටී ඇති තත්ත්වයට වගකිව යුත්තේ ඔවුන්ම බවයි.

අප්‍රිකාන-ඇමරිකානු කම්කරුවන් අමතමින් කරන ලද ඔබාමාගේ දේශනය බුකර් ටී වොෂින්ටන්ගේ (1856-1915) ස්ථාවරයට බොහෝ සෙයින් සමාන වේ. කලු ජාතික ගුරුවරයෙකු වූ ඔහු තර්ක කලේ කලු මිනිසුන් වෙන්කොට තබන ලද දකුනු දේශය තුල කුරිරුබවට හා දුගී බවට එරෙහිව කලු මිනිසුන්ට කටයුතු කල හැකි එකම මග දේශපාලනයේ නියැලීම ක්‍රියාකාරකම් නොව ''ස්වයං උපකාරය'' තුලින් තම තත්ත්වය වැඩි දියුනු කර ගැනීම බවය.

1909 වසරේ දී එන්ඒඒසීපී සංවිධානය පිහිටුවීමට ඩබ්ලිව්.ඊ.බී. ඩූබුවාට (1868-1963) මං පාදන ලද්දේ බුකර් ටී වොෂින්ටන් කෙරේ පැවති තදබල විරෝධය හේතු කොට ගෙන බව අවධාරනයෙන් කිව යුතු ය. එන්ඒඒසීපී සංවිධානය ''පිහිටුවන ලද්දේ දීමනාවක් පසුපස යමින් නොවේ ය'' යි ඔබාමා ප්‍රකාශ කර සිටී. එය එසේ විය හැක. එහි කෙතරම් සීමිතකම් තිබිය දී වුව ද එම සංවිධානය පිහිටුවන ලද්දේ කලු ජාතික ජනගහනය මර්දනය කිරීමට එරෙහි සටන් කරන දේශපාලන ව්‍යාපාරයක් වශයෙනි.

සිය පර්යාලෝකයෙහි සාරභූත හරය ඔබාමා අනාවරනය කලේ ඔහුගේ මෙම ප්‍රකාශය තුලිනිඃ ''කලු මනිසුන් වෙන්කර තබන ජිම් ක්‍රෝ නීති පෙරලා දැමීම හේතු කොට ගෙන අද දින කලු ජාතික ප්‍රධාන විධායක නිලධාරීහු ෆෝර්චූන් 500 සමාගම් පාලනය කරති. (අත්පොලසන්), සිවිල් අයිතිවාසිකම් නීති සම්මත වීම හේතු කොට ගෙන කලින් යුගයක ඡන්දය ප්‍රකාශ කිරීමට පමනක් නොව, වතුර බිඳක් බීමට පවා අයිතියක් නොතිබුනු ස්ථානවල, කලු ජාතික නගරාධිපතිවරු, කලු ජාතික ආන්ඩුකාරවරු හා කලු ජාතික කොංග්‍රස් සමාජිකයෝ සේවය කරති. තවද, සාමාන්‍ය මිනිසුන් එතරම් අසාමාන්‍ය දෑ කිරීම හේතු කොට ගෙන... අද සවස් භාගයෙහි මෙතැන දී ඇමරිකා එක්සත් ජනපදයෙහි 44වැනි ජනාධිපති වශයෙන් ඔබ ඉදිරියේ පෙනී සිටීමට මා හට මං පෑදුනි. (අත්පොලසන්)''

බොහෝසෙයින් හොඳින් සප්පායම් වූ සිය ශ්‍රාවක පිරිසගෙන් මෙම උද්ධෘතයට ලැබුනේ උද්‍යෝගිමත් ප්‍රතිචාරයකි. මෙම සමාජ ස්තරයට, සිවිල් අයිතිවාසිකම් ව්‍යාපාරයෙහි අර්ථය වූයේ ''කලු ජාතික විධායක නිලධාරින්'' හා කලු ජාතික දේශපාලනඥයින් තට්ටුන් නිර්මානය කිරීමයි. කලු ජාතික කම්කරුවන් වෙනුවෙන් ඔවුන් තුල ඇත්තේ අවඥාවක් පමනි.

සිවිල් අයිතිවාසිකම් ව්‍යාපාරයෙහි ප්‍රගතිශීලී හරය පදනම් වූයේ සමානතාව උදෙසා අරගලය මත ය. එසේ වුව ද, 1960 ගනන්වල සමාජීය ගැටුම් තීව්‍රවත්ම - 1967-68 වර්ෂවල සුලු ජන කොටස් වෙසෙන පෙදෙස්වල නැගිටීම් ද ඇතුලුව - නොයෙකුත් ප්‍රතිජානන ක්‍රියාකාරී ප්‍රතිපත්ති තුලින් කලු ජාතික මධ්‍යම පන්තික ස්තරයක හොඳ හිත වගා කිරීමට දේශපාලන සංස්ථාපනය උත්සුක වූ අතර එය ධනේශ්වර සංස්ථාපනයට ඒකාග්‍ර කිරීමට උනන්දු විය. පසුගිය සිව් දශකය තුල, කලු ජාතික ජනගහනය තුල සමාජ අසමානතාව අති විශාල ලෙස වැඩිවී ඇත.

ඔබාමා මේ ක්‍රියාවලියෙහි ප්‍රතිඵලයයි. අප්‍රිකානු ඇමරිකානුවන්ගේ අරගලවල සහභාගිත්වය පිලිබඳ කිසිදු සඳහනක් ඔබාමාගේ පෞද්ගලික හෝ දේශපාලන ඉතිහාසය තුල සොයාගන්නට නැත. ඔහුගේ ජීවිතයේ මුල් වකවානුවේ දී ම බලගතු දේශපාලන හා මූල්‍යමය පංගුකරුවන් විසින් ඔහු තෝරාගෙන පුහුනු කරනු ලැබ අවසන දී ඔවුන් විසින් ම ඔහු ධවලමන්දිරය කරා ද යොමු කලේ ය. ඔහුට විශේෂිත වූ වාර්ගික පසුබිම හේතු කොට ගෙන ඔහු දක්ෂිනාංශික දේශපාලනය වඩාත් හොඳින් අලෙවි කල අයෙකු ලෙස දිස්වින.

කලු ජාතික ජනගහනයෙන් බහුතරයකගේ අවශ්‍යතාවන් වර්ධනය කිරීම වෙනුවට අප්‍රිකානු ඇමරිකානු කම්කරුවන් හා සමස්තයක් වශයෙන් කම්කරු පන්තියම වෙත තියුනු ප්‍රහාරයක් එල්ල කිරීම සඳහා අනන්‍යතා දේශපාලනය යාන්ත්‍රනයක් බවට පත්ව ඇත. ඔහුගේ පාලන තන්ත්‍රය විශාල මූල්‍ය ආයතනවලට ඩොලර් ට්‍රිලියන 12 කට අධික මුදල් සම්භාරයක් පිරිනමා ඇති අතර කම්කරු පන්තියේ වැටුප් හා ජීවන තත්ත්වයන් පහත හෙලීම සඳහා මෝටර් රථ කර්මාන්තය බංකොලොත් බවට පත් කිරීමට ද කටයුතු කර ඇත. ඔබාමා යෝජනා කර ඇති සෞඛ්‍ය ආරක්ෂන ප්‍රතිසංස්කරනයෙහි ප්‍රතිඵලය වනුයේ අනිවාර්ය රක්ෂන ක්‍රමයක් හා සලාක කරන ලද ප්‍රතිකාර ක්‍රමයක් බිහි කිරීම ය. අභිවෘද්ධිය සඳහා මූලික අවශ්‍යතාව ලෙස සිය දේශනයෙහි දී හුවා දක්වන ලද අධ්‍යාපනය සම්බන්ධයෙන් පොදු පාසල් වසා දැමීමට, බලපත්‍ර ලත් පාසැල් ව්‍යාප්ත කිරීමට හා ගුරුවරුන් වෙත ප්‍රහාරයක් එල්ල කිරීමට ඔබාමා සහාය දක්වයි.

ඔබාමාගේ දේශනය ද ඔහුගේ පාලන තන්ත්‍රයෙහි ප්‍රතිපත්තිවල සමස්ත හරය ද ප්‍රකාශ කරනුයේ සමාජයෙහි අති මූලික බෙදීම වර්ගය නොව, පන්තිය බවයි.

ටොම් එලී විසිනි.

© www.wsws.org